**උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2021**

**------------------------------------------------------**

උපායමාර්.ගික නගර සංවර්.ධන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්.ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යාන්තර සංවර්.ධන සංගමය අතර එළඹි 2014 සැප්තැම්බර් 12 දිනැති අංක 5428 - එල්කේ දරණ මූල්‍ය ගිවිසුමේ II (බී)(3) වගන්තිය හා 2016 ජූලි 20 දිනැති අංක 5800 - එල්කේ දරණ අතිරේක මූල්‍ය ගිවිසුම ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්.ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්.තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

**-----------------------------------------------------------------------------------------------**

මූල්‍ය ගිවිසුම අනුව, වර්.තමාන නාගරික සංවර්.ධන, සහ නිවාස අමාත්‍යාංශය, එවකට මහනගර හා බස්නාහිර පළාත් සංවර්.ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්.ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරාගත් නාගරික සේවා හා පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 34,912.48 කට සමාන එ.ජ. ඩොලර් මිලියන 257.08 ක් වන අතර ඉන් රු. මිලියන 27,507 කට සමාන එ.ජ. ඩොලර් මිලියන 202 ක් සැපයීමට ජාත්‍යාන්තර සංවර්.ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 7,405.48 ක මුදල ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි. එසේ වුවත් ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ කාලය 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්.ඝ කර තිබුණි.

## 1.3 මතය

**------**

මෙම වාර්.තාවේ 02 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්.ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්.තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්.ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්.තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්.ශවයන් විසින් දරනු ලබයි. ව්‍යාපෘතියේ වාර්.ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදී ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්.තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්.තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරිමේදි එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කීරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්.ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනිමේදි හා තක්සේරු කිරීමේදි අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්.ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු.මි | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ කාලසීමාව තුළ මහා භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද සමානාත්මතා ගැලපීම් 2021 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. | 2,650.53 | අපගේ ගැලපීම් සිදු කරනු ලබන්නේ ඩොලර් ($) ගිණුම් සහ ව්‍යාපෘති රුපියල් ගිණුමෙන් මිස භාණ්ඩාගාර ලේඛන වලට අනුව නොවේ. | නිවැරදි කළ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>(i) FR 757 සහ 760 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන පරිදි කාණ්ඩ 17 කට අයත් අයිතම 97 ක හිඟය සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිරීක්ෂණයට එකඟ වේ. නමුත් වර්තමානයේ රටේ පවතින තත්ත්වය ප්‍රමාදයට හේතු විය. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිරීක්ෂණය වූ අඩුපාඩු සම්බන්ධයෙන් නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | (ii) FR 770 | සමාලෝචිත වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ පෙන්වා ඇති පරිදි කාණ්ඩ 14 කට අයත් බැහැර කරන ලද භාණ්ඩ 33 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිරීක්ෂණයට එකඟ වේ. අදාළ අංශ වලට ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනුම් දී ඇත. | රජයේ රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ආ) | 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි 9.3 ඡේදය | චක්‍රලේඛ ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | රටේ පවතින තත්ත්වය මේ සඳහා හේතු විය. | ව්‍යාපෘතිය විසින් චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ප්‍රසම්පාදන මාර්.ගෝපදේශ (i) යොමු 2.8.4 | තාක්ෂණික ඇගයීම් කමිටුවට මූල්‍ය ගිණුම්කරණ කටයුතු සම්බන්ධ පසුබිමක් ඇති විෂය විශේෂඥයෙකු නියෝජනය වී නොතිබීම හේතුවෙන් ගාල්ල මහ නගර සභාවේ ගබඩා සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුගේ ඌන මූල්‍ය ධාරිතාවය හේතු කොට ගෙන ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රගතිය ඉතා මන්දගාමී වී තිබුණි. | එකඟ වේ. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීම සඳහා ඉහළ කළමනාකාරීත්වයට යොමු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්.ගෝපදේශ ව්‍යාපෘතිය විසින් අනුගමනය කළ යුතුය. |
| | (ii) යොමු 1.2.1 සහ 2.4 | ගාල්ල මොරගොඩ ප්‍රධාන ඇළ සහ පන්සල අතුරු ඇළ මාර්.ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරාගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කළ යුතු වගකීම වන අදාළ ප්‍රසම්පාදන රාජකාරි නිසි ලෙස ඉටු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය අතරමග නතර කිරීමට සිදු වී තිබුණි. | එකඟ වේ. | රජයේ ප්‍රසම්පාදන මාර්.ගෝපදේශ ව්‍යාපෘතිය විසින් අනුගමනය කළ යුතුය. |
| | (iii) යොමු 7.9.2 (j) | (මුල් සහ සංශෝධිත) ඉංජිනේරු ඇස්තමේන්තු දෙකක් මත පදනම්ව වෙන වෙනම කොන්ත්‍රාත් කරුවන් දෙදෙනෙකු නිර්.දේශ කරමින් එකම කොන්ත්‍රාත්තුවක් සඳහා දින 25ක කාලයක් තුළ එකම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වෙනම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්.තා දෙකක් සකස් කර තිබුණි. මෙම ලංසු ඇගැයීමේ ක්‍රියාවලියේ දී ඉංජිනේරු ඇස්තමේන්තුව සංශෝධනය කිරීමෙන් පසුව, වැඩ අයිතමවල රේට තාත්වික නොවන බව දක්වමින් නිර්.දේශ කර නොතිබූ අසාර්.ථක කොන්ත්‍රාත්කරුම නැවත එම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම මිල ගණන් යටතේම නිර්.දේශ කර තිබුණි. | නිරීක්ෂණයට එකඟ වූ නමුත් අනුමත කමිටු අනුමැතිය සහිතව පියවර ගෙන ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්.ගෝපදේශ ව්‍යාපෘතිය විසින් අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) යොමු 3.9.1 | මෘදුකාංග සංවර්.ධන වේදිකාව - 2021 දෙසැම්බර් 31 දක්වා බස් පර්.යන්ත මෙහෙයුම් කළමනාකරණය සහ සංක්‍රාන්ති බස් මෙහෙයුම් සඳහා තොරතුරු තාක්ෂණ වේදිකාවක් සංවර්.ධනය කිරීම.<br>අ) ගිවිසුම් ප්‍රකාරව බස් රථ 1500ක ඉදිරිපස පැත්ත (මුහුණ) තීන්ත ආලේප කිරීම සඳහා රුපියල් මිලියන 18.7ක වටිනාකමට මිල ගණන් කැඳවීම වෙනුවට,බස්රථ 02ක සම්පූර්ණයෙන්ම ස්ටිකර් ඇලවීමේ කොන්ත්‍රාත්තුව සහ බස්රථ 135ක අර්.ධ වශයෙන් ස්ටිකර් ඇලවීම සිදු කර තිබුණි. චක්‍රලේඛ අනුව එක් ප්‍රජා පාදක සංවිධානයකට පිරිනැමිය හැකි වටිනාකම රුපියල් මිලියන 5 ක් නොඉක්ම වුවද කොන්ත්‍රාත් ප්‍රදානයේදී සුදුසුකම් ලත් වෙනත් ප්‍රජා මූලික සංවිධාන පිළිබඳව ඇගයීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | එකඟ වේ. | ගිවිසුමට අනුකූල නොවීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ පිළිතුරු ලබාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2021 සැප්තැම්බර් 29 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021<br>i) 2.1 වගන්තිය | ප්‍රජා පාදක සංවිධානවලට සෘජු කොන්ත්‍රාත්තු ලබාදීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරන ලද නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් සුදුසුකම් තහවුරු කර සුදුසුකම් ඇති ප්‍රජා පාදක සංවිධානයක් තෝරාගත යුතුය. අදාළ කොන්ත්‍රාත්තුවේදී ග්‍රාම සංවර්.ධන සමිතිය එවැනි කමිටුවක් මඟින් තෝරාගෙන නොතිබුණි. | ලෝක බැංකුවේ සහ අදාළ ප්‍රසම්පාදන කමිටුවල අනුමැතිය ඇතිව ප්‍රසම්පාදනය සිදු කරන ලදී. | ගිවිසුමට අනුකූල නොවීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ පිළිතුරු ලබාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| | (ii) 2.7 වගන්තිය | ඉහත චක්‍රලේඛයට අනුව, මෙම ප්‍රජා පාදක සංවිධානවල කොන්ත්‍රාත් | අවබෝධතා ගිවිසුමට අනුව සිදු කර යුතු | ගිවිසුමට අනුකූල නොවීම සම්බන්ධයෙන් මධ්‍යම |

| | | |
|---|---|---|
| කටයුතු නිසි ප්‍රමිතීන්ට අනුව සිදු කෙරෙන බවටත්, අවශ්‍ය තාක්‍ෂණික අධීක්‍ෂණය සමස්ත කාලය තුළම සිදු කරන බවටත් දෙපාර්තමේන්තු ප්‍රධානියා, අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා සහතික කළ යුතුය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය තුල එය සිදු කර නොතිබුණි. | මෙහෙයුම් ක්‍රියා පටිපාටීන් දක්වා තිබුණි. | පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ පිළිතුරු ලබාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**3.** **භෞතික කාර්.යසාධනය**

**3.1** **ව්‍යාපෘති ක්‍රියාකාකරම්වල භෞතික ප්‍රගතිය**

| අංකය | සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්.දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්.යසාධනය ප්‍රතිශතය | ළඟා කරගත් කාර්.යසාධනය ප්‍රතිශතය | | | |
| (අ) | ගාලු නගරයේ ගංවතුර පාලන පද්ධතිය | 100% | 0% | ගාල්ල නගරයේ ගංවතුර පාලන කාණු පද්ධති 16 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබූ අතර සැලසුම්වලට අනුව වැඩ සඳහා අවශ්‍ය ඉඩම් පවරාගෙන නොතිබුණි. මේ අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයට සහ ගංවතුර පාලන කටයුතුවල දී මෙම තත්ත්වය සෘජුවම බලපා ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ. මේ පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු කර ඇති අතර, එම තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීමට අපේක්ෂා කරයි. | නියමිත ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්.යක්ෂම සහ ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ගාල්ල මොරගොඩ ඇළ ප්‍රධාන ඇළ සහ පන්සල් | 100% | 20% | මෙම කොන්ත්‍රාත්තුව 2017 මාර්.තු 06 වන දින රුපියල් මිලියන 844.9 කට ප්‍රදානය කර තිබූ අතර 2019 සැප්තැම්බර් 07 දින වැඩ නිම | එකඟ වේ. | නියමිත ව්‍යාපෘති කාල සීමාව තුල ව්‍යාපෘති |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | අතුරු ඇල මාර්.ගය ප්‍රතිසංස්කරණය කිරීම | | | කිරීමට නියමිත විය. මුල් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අනුව මුළු දුර මීටර් 4,250 ක් සම්පූර්.ණ කර යුතුව තිබුණි. කෙසේ වෙතත්, දුර්වල භෞතික ප්‍රගතිය හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2019 අප්‍රේල් 11 දින අවසන් කර තිබූ අතර එදිනට 20% ප්‍රගතියක් වාර්.තාවී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු පාරිසරික හා සමාජ ආරක්ෂණ කොන්දේසි උල්ලංඝනය කර තිබුණි. | | ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්.යක්ෂම සහ ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ගාල්ල මොරගොඩ ඇළ ප්‍රධාන ඇළ සහ පන්සල අතුරු ඇල මාර්.ගය ප්‍රතිසංස්කරණය සඳහා කොන්ත්‍රාත්තු වැඩ සම්පූර්.ණ කර නිවැරදි කිරීම (0+000 සිට 1 + 850 දක්වා) | 100% | 72% | (i) මොරගොඩ ඇළේ දිග මීටර් 4,250ක් ප්‍රතිසංස්කරණ කිරීමේ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 736.03 ක් වූ අතර දිග මීටර් 1,850 ක දුරක් පමණක් වැඩ සම්පූර්.ණ කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකුට රුපියල් මිලියන 462.6 කට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. ඒ අනුව ඇළ මාර්.ගය මුළු දුර සම්පූර්.ණ කර ගත නොහැකි වීම හේතුවෙන් මහජනතාවට එහි සම්පූර්.ණ ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ වෙතත්, ප්‍රධාන ඇළේ සම්පූර්.ණ දිග සඳහා ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර ඒ සඳහා රු. මිලියන 397.6ක් ගෙවීම් සිදු කර තිබුණි. | එකඟ වේ. | නියමිත ව්‍යාපෘති කාල සීමාව තුල ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්.යක්ෂම සහ ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| | | | | (ii) ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේදී ඉඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මොරගොඩ ඇළ ප්‍රධාන ඇල ප්‍රතිසංස්කරණ කටයුතු ඇතැම් ප්‍රදේශයන්හි සිදු කිරීමට නොහැකි වීම නිසා කොන්ත්‍රාත්කරුට රුපියල් මිලියන 112ක (Pre-cast pilling) පෙර වාත්තු ගොඩනැගීමේ කටයුතු සිදු කිරීමට නොහැකි විය. නිසි ඇගැයීමකින් තොරව ඉඩම් අත්පත් | මෙම උප ව්‍යාපෘතිය අවසන් කර භාර දී ඇත. | නියමිත ව්‍යාපෘති කාල සීමාව තුල ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | කර ගැනීම ඉහත තත්ත්වයට ප්‍රධාන හේතුව වූ අතර, ව්‍යාපෘතියට පෙර වාත්තු ගොඩනැගීමේ (Pre-cast pilling) සඳහා නැවත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට සිදු වී තිබුණි. | | කාර්යක්ෂම සහ ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ගාල්ල මහ නගර සභාවේ ගබඩා සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම | 100% | 90% | මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2019 අප්‍රේල් 24 වන දින රුපියල් මිලියන 135.65 ක වටිනාකමට ප්‍රදානය කරන ලද අතර ඉදිකිරීම් කාලය දින 270 කි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය මගින් දින 113ක දින දීර්ඝ කිරීම (EOT 3) සහ ව්‍යාපෘතියේ ඉල්ලීමට අනුව, තාත්වික වැඩසටහනක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, 2022 මැයි 23 සිට කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. | එකඟ වේ. | නියමිත ව්‍යාපෘ කාල සීමාව තුල ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යක්ෂම ස ඵලදායී ව්‍යාපෘ කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | යාපනය පොන්නාලෙයි පේදුරුතුඩුව පාර (AB 21) දක්වා පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම 1+830 km සිට 14+600 km දක්වා | 100% | 76% | මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 1,110.15 කට 2019 අගෝස්තු 12 වන දින ප්‍රදානය කර තිබූ අතර 2021 මැයි 15 වන දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. උපදේශන ආයතනය කාලානුරූපීව නිසි අධීක්ෂණයක් නොමැතිවීම ප්‍රමාදය සඳහා සෘජුවම බලපා තිබූ අතර කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණද, මාර්ගයේ මුළු දුර (කි.මී.) ප්‍රමාණය සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වී තිබුණි. | එකඟ වේ. | නියමිත ව්‍යාපෘති කාල සීමාව තුල ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යක්ෂම සහ ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්.දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර ධර්.මාශෝක මාවත කිලෝමීටර් 3.39 ක මාර්.ගය පුනරුත්ථාපනය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව 2016 ජුලි 07 වන දින රුපියල් මිලියන 796.42 කට ප්‍රදානය කර 2018 ජුලි 07 වන දින අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද 2019 ජුලි 14 දින වන විට කොන්ත්‍රාත් වැඩ අතරමඟ අත්හැරීම නිසා එතෙක් නිම නොකළ ඉතිරි වැඩ සඳහා කොන්ත්‍රාත් කරුවන් දෙදෙනෙකුට රුපියල් මිලියන 512 ක වියදමක් දරා තිබුණි. කොන්ත්‍රාත් වැඩ අතරමග අත්හැරීම හේතුවෙන් ව්‍යාපෘතියට රුපියල් මිලියන 121.5 ක අමතර වියදමක් දැරීමට සිදු වී තිබුණි. | එකඟ වේ. | වත්මන් ප්‍රගතිය ඇගයීමෙන් පසු ඉතිරි කොන්ත්‍රාත් කටයුතු කඩිනම් කිරීමට නිවැරදි ක්‍රියාමාර්.ග ගත යුතුය. |
| (ආ) | ලෝක බැංකුව විසින් ලබා දීමට එකඟ වූ ඩොලර් මිලියන 202 ක ණය මුදලෙන්, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්.යන්තය (KMTT) ඉදිකිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 92 ක් වූ අතර වෙන් කර ඇති ඇමරිකානු ඩොලර් මිලියන 65 න් 2021 දෙසැම්බර් 31 වන දිනට ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි වීම හේතුවෙන් ඩොලර් මිලියන 27 අවලංගු කර තිබුණි. එනිසා සමාලෝචිත වර්.ෂය අවසානයේදී ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී ඇති බව විගණනයේදී අනාවරණය විය. | එකඟ වේ. | ව්‍යාපෘතියේ සමස්ත භෞතික සැලසුම්වලට අනුකූලව ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ශක්තිමත් හා ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 අරමුදල් උපයෝජනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්.දේශය |
|---|---|---|---|
| (අ) | ලැබී ඇති තොරතුරුවලට අනුව, ණය දෙන නියෝජිතායතනය විසින් සපයන ලද ඇමරිකානු ඩොලර් මිලියන 202 ට සමාන රුපියල් මිලියන 30,300 ක මුළු අරමුදල්වලින් සියයට 65.6 ක් නියෝජනය කරමින් ඇමරිකානු ඩොලර් මිලියන 72.14 ට සමාන රුපියල් මිලියන 14,567.64 ක් භාවිතා කිරීම ආරම්භ | එකඟ වේ. පැවතුණු තත්වයන්ට අනුව ණය අරමුදල් ඌන උපයෝජනයට හේතු වී තිබුණි. | ව්‍යාපෘතියේ කාර්.ය සාධනය හා අයවැය ක්‍රියාකාරී සැලසුම් සමඟ නියාමනය කර නිවැරදි ක්‍රියාමාර්.ග අරමුදල් උපයෝජනයේදී අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | කළ දින සිට වසර 7 ½ කාලපරිච්ඡේදයක් ඉකුත් වූ පසු උපයෝජනය කර තිබුණි. | | කළමණාකරණ තීරණයන් ලබා දිය යුතුය. |
| (ආ) | නාගරික සංවර්.ධන හා නිවාස අමාත්‍යාංශය විසින් වැය විෂය කේතය 12-02-07-08-2506 (17) යටතේ මහනුවර, ගාල්ල උපාය මාර්.ගික නගර සංවර්.ධන ව්‍යාපෘතියට ලබා දී ඇති රුපියල් මිලියන 925 ක් යාපනය ව්‍යාපෘතිය වෙත මාරු කර තිබුණි. කෙසේ වෙතත්, එම සම්පූර්.ණ මුදලම අදාළ කාර්.යය සඳහා යොදා නොගෙන ඉතිරි වී තිබුණි. | එකඟ නොවේ. මෙයින් වැඩි කොටසක් පසුව යාපනයේ අරමුදල් අවශ්‍යතා සඳහා උපයෝගි කර ඇත. | අනෙකුත් ව්‍යාපෘති අතර අරමුදල් හුවමාරුව සීමා කිරීමට පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | නාගරික සංවර්.ධන හා නිවාස අමාත්‍යාංශය මගින් 123-02-07-08-2506(12) වැය විෂය කේතය යටතේ මහනුවර, ගාල්ල උපායමාර්.ගික නගර සංවර්.ධන ව්‍යාපෘතියට ලබාදුන් රුපියල් මිලියන 1,300 ක මුදලක් උපාය මාර්.ගික නගර සංවර්.ධන යාපනය ව්‍යාපෘතියට මාරු කර ඇත. කෙසේ වෙතත්, එම මුදලින් සියයට 51ක් අදාළ කාර්.යය සඳහා උපයෝජනයට නොගෙන ඉතිරි කර තිබුණි. | මෙය ව්‍යාපෘති කාර්.යයන්ට බලපා නොමැති අතර අරමුදල් ප්‍රභවය වෙනස් වීම හේතුවෙන් විවිධ වැය කේත අතර වෙනස්කම් සිදු කරන ලදී. | අනෙකුත් ව්‍යාපෘති අතර අරමුදල් හුවමාරුව සීමා කිරීමට පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්.යය/ උපයෝජනය නොවීම/ ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්.දේශය |
|---|---|---|
| බස් මෙහෙයුම් කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ වේදිකාවක් සංවර්.ධනය කිරීම සඳහා මෘදුකාංග සංවර්.ධන වේදිකාවට අදාළ ව්‍යාපෘති මෙහෙයුම් මධ්‍යස්ථානය සඳහා ලැබුණු ලැප්ටොප් පරිගණක 16 න් ලැප්ටොප් පරිගණක 08 ක් පමණක් භාවිත කර ඇත. රු. මිලියන 1.2 ක් වටිනා ඉතිරි පරිගණක 08 භාවිතා කර නොතිබුණි. | මෙය ආරම්භ කරමින් යන ව්‍යාපෘතියක් බැවින් අනාගතයේදී වත්කම් ප්‍රයෝජනයට ගනු ඇත. | ව්‍යාපෘති පිරිවැය වඩාත් කාර්.යක්ෂම හා ඵලදායී මූලධර්.මයන්ට අනුකූලව සිදු විය යුතුය. |

### 3.5 පාරිසරික ගැටලු සම්බන්ධ නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්.දේශය |
|---|---|---|---|
| (අ) | යාපනය නගරයේ පාසයියූර් පොකට් උද්‍යාන සැලසුම් කිරීමේ අදියර - 02<br>i) විනෝද උද්‍යාන සංවර්.ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර ස්ථානය තෝරාගෙන ඇත. මේ හේතුවෙන් පාරම්පරිකව ධීවර කටයුතුවල නිරත වූ ගම්වාසීන්ගේ ජීවනෝපායට බලපා තිබූ අතර සංචාරකයින්ට සහ ප්‍රතිලාභීන්ට උද්‍යානයේ විවේක කාලය ගත කිරීමට සුදුසු පරිසරයක් නොමැති බව නිරීක්ෂණය විය. | එය අසල්වැසි උද්‍යානයක් ලෙස යෝජනා විය. | වඩාත් යෝග්‍ය පරිසර කළමණාකරණ පද්ධතින් හඳුන්වා දිය යුතුය. |
| | ii) මෙම උද්‍යානයට ආරක්ෂිත වැටක් භාවිතා කරන්නන්ගේ පහසුව සඳහා සවි කර නොතිබූ අතර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කිසිදු ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. වෙරළ අවට අපද්‍රව්‍ය විසිරීම නිසා වෙරළාසන්න පරිසර පද්ධතියට හානි සිදුවන බව නිරීක්ෂණය විය. | මේ වන විට ආරක්ෂිත අත් රේල් කුඩා බඳුන් සවි කර වත්කම භාර දීම සිදු කර ඇත. | වඩාත් යෝග්‍ය පරිසර කළමණාකරණ පද්ධතින් හඳුන්වා දිය යුතුය. |